UPDF
WWW.UPDF.COM

ආයතනයේ නම : වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගණු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

நிறுவனத்தின் பெயர் : வனப் பாதுகாப்புத் திணைக்களம்

பாராளுமன்றத்தின் அரசாங்கக் கணக்குகள் பற்றிய குழுவினால் சமர்ப்பிக்கப்பட்ட அறிக்கை தொடர்பில் நிலையியற் கட்டளை 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புகளையும் எடுத்த நடவடிக்கைகளையும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Name of the institution: Department of Forest Conservation

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the committee on public Accounts in terms of Standing Order NO. 119(4)

UPDF
WWW.UPDF.COM

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 290
ආයතනයේ නම : වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

2021 මූල්‍ය වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය හා ප්‍රගති සමාලෝචන වාර්තාවෙන් ඉදිරිපත් කර ඇති දුර්වලතා	ඒ සඳහා ගෙන ඇති ක්‍රියා මාර්ග / වර්තමාන තත්වය
පළමු කොටස :	
1. ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබිණි.	➢ දෙපාර්තමේන්තුව සතු ස්ථාවර වත්කම් සිගාස් වැඩසටහනට ඇතුළත් කර ඇත. මුදල් අමාත්‍යාංශය විසින් ලබා දී ඇති උපදෙස් පරිදි ස්ථාවර වත්කම් ලේඛනය සිගාස් වැඩසටහන මඟින් පවත්වා ගෙන යනු ලබයි.
2. හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබිණි.	➢ දෙපාර්තමේන්තුව සතුව ශාඛා/උප කාර්යාල විශාල සංඛ්‍යාවක් පවතින අතර , මු.රෙ.102 යටතේවන නැතිවීම්/හානිවීම් සිදු වුවහොත් , එය සිදු වූ විගස ම ප්‍රධාන කාර්යාලය දැනුවත් කරන ලෙස නිලධාරීන් දැනුම්වත් කර ඇත. ඒ අනුව ප්‍රධාන කාර්යාලයේ පවත්වාගෙන යනු ලබන හානි/පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යනු ලැබේ.
3. විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරන සෑම විගණන විමසුමක් සඳහා ම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	➢ බොහෝ විගණන විමසුම් කලාප කාර්යාලවලට, දිසාවන කාර්යාලවලට සහ විවිධ අංශවලට අදාල ඒවා වන බැවින් තොරතුරු ගෙන්වා ගැනීමේ දී ඒ සඳහා කාලයක් ගත වේ. එවැනි විගණන විමසුම් සඳහා මසක් තුල පිළිතුරු සැපයීම ප්‍රයෝගිකව අපහසු කාර්යයකි. හැකි සෑම අවස්ථාවකම අවම කාලයක් තුළ පිළිතුරු සැපයීමට කටයුතු කෙරේ.
4. 2017.06.26 දිනැති අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 7 ඡේදය ප්‍රකාරව 2018 වර්ෂයේ දී මිළදී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබිණි.	➢ 2023 මුදල් වර්ෂයේ සිට දෙපාර්තමේන්තුව මිළදී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත වාර්තා කරන අතර , ඉදිරියේදීත් එය අඛණ්ඩව සිදු කරනු ලැබේ.
5. 2017.06.26 දිනැති අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 13 ඡේදය ප්‍රකාරව චක්‍රලේඛයේ විධිවිදාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම සඳහා සුදුසු නිලධාරියකු පත්කර කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත දන්වා නොතිබිණි.	➢ අදාළ තොරතුරු පද්ධති සඳහා ලියාපදිංචි වී තොරතුරු වාර්තා කිරීමට හා සම්බන්ධීකරණය කිරීමට නිලධාරියකු පත්කර කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත දන්වා ඇත.

දිනැති අංක 01/2020 1 කොටසේ 11.1 ඡේදයේ සඳහන් කාල රාමුව ඇතුළත මු.රෙ.756(6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබිණි.	➢ 2022 වර්ෂයේ රට තුළ උද්ගත වූ ආර්ථික,සමාජීය හා දේශපාලන අර්බුද තත්වය හේතුවෙන් කාර්යාල කටයුතු නිසි ලෙස ක්‍රියාත්මක නොවූ අතර නිලධාරී පැමිණීම ද සුපුරුදු පරිදි සිදු නොවී ය. විශේෂයෙන් ම රටෙහි ඇති වූ තෙල් අර්බුදය නිසා ප්‍රාදේශීය කාර්යාලයන්ගේ භාණ්ඩ සමීක්ෂණ කටයුතුවලට නිලධාරින්ට නියමිත දිනයන්ට සහභාගී වීමට නොහැකි වූ අතර , ඒ හේතුවෙන් නියමිත දිනට භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කිරීමට නොහැකි විය .කෙසේ වෙතත් 2022.03.31 දින අදාළ වාර්තාව විගණකාධිපති වෙත යොමුකර ඇත.මේවන විට ප්‍රමාදයකින් තොරව භාන්ඩ සමීක්ෂණයන් සිදුකර අදාළ වාර්තා නියමිත දිනයන්ට ලබා දීමට කටයුතු කරමින් පවතී.
7. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ,ඌනතා පිළිබඳ වන නිර්දේශය ද අනෙකුත් නිර්දේශ ද නියමිත කාල වකවානුව තුළ ක්‍රියාත්මක කර නොතිබිණි.	➢ නියමිත කාල වකවානුව තුළ ක්‍රියාත්මක කිරීමට නොහැකි වුවද , වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ,ඌනතා පිළිබඳ වන නිර්දේශයන් හා අනෙකුත් නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත. ඉදිරියේ දී එම නිර්දේශයන් නියමිත කාලවකවානුව තුළම ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමි.
8. සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබිණි.	➢ දෙපාර්තමේන්තුවට අයත් සියලුම වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කිරීමට කටයුතු කෙරෙමින් පවතී.
9. වාහනයක් ගර්හිත වී මාස 8කට වඩා අඩු කාලයක දී අපහරණය කර නොතිබිණි.	➢ හැකි සෑම අවස්ථාවක දී ම අවම කාලයක් තුළ අදාළ අපහරණ කටයුතු සිදුකර ඇති අතර, ඉදිරියේ දී වාහනයක් ගර්හිත වී මාස 8කට වඩා අඩු කාලයක දී අදාළ අපහරණ කටයුතු සිදු කිරීමට කටයුතු කරමි.
10. සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා නොතිබිණි.	➢ 2024 වර්ෂය වන විට දෙපාර්තමේන්තුව සතු සියලුම වාහනවල ලොග්පොත් යාවත්කාලීනව පවත්වාගෙන යනු ලැබේ.
11. රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන්මු.රෙ.103,104,109 හා 110 ප්‍රකාරව නිසි කටයුතු කර නොතිබිණි.	➢ සියලු වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ.විධිවිධාන අනුව කටයුතු කෙරේ.
12. 2016.12.29. දිනැති අංක 2016/30 දරණ රා.පරි චක්‍ර ලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් කර නොතිබිණි.	➢ 2023 වර්ෂයේ සිට අදාළ චක්‍රලේඛයේ උපදෙස් පරිදි දෙපාර්තමේන්තුව සතු වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් සිදුකරනු ලැබේ.
13. බැංකු සැසඳුම් ප්‍රකාශ නියමිත දිනට පිළියෙල කර සහතික කර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබිණි.	➢ සිගාස් වැඩසටහන යාවත් කාලීන කිරීමේ දී ඇති වූ ගැටලුවක් නිසා වසරේ මුල් කාර්තුව තුළ බැංකු සැසඳුම් පිළියෙළ කිරීම ප්‍රමාද වුවද , අනතුරුව නියමිත දිනට ඉදිරිපත් කර ඇත.2024 මුදල් වර්ෂයේ සිට ප්‍රාදේශීය කාර්යාලයන් හි බැංකු සැසඳුම් , නියමිත දිනට සකස්කර විද්‍යුත් තැපෑල මඟින් විගණනය සඳහා ඉදිරිපත් කරන ලෙස නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.

UPDF
WWW.UPDF.COM

...දුම් ප්‍රකාශවලින් ...ු ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ.ප්‍රකාරව මාසයක් අතුළත නිරවුල් කර නොතිබිණි.	➢ නියමිත කාලය තුළ සිදු කිරීමට නොහැකි වුවද ,බැංකු සැසඳුම් ප්‍රකාශයන්ගෙන් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂයන් නිවැරදි කිරීමට කටයුතු කර ඇත.2024 මුදල් වර්ෂයේ සිට අදාළ නිවැරදි කිරීම් නියමිත කාලය තුළ දීම සිදු කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.
15. ප්‍රතිපාදන සීමාව ඉක්මවා වියදම් දැරීම සිදුව තිබුණි.	➢ ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා වියදම් දැරීම් සිදුව නොමැත.අවශ්‍ය වූ විට මු.රෙ.විධිවිධාන ප්‍රකාරව ප්‍රතිපාදන මාරු කිරීම් නිසි අනුමැතීන් මත සිදුකර ඇත.
16. වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	➢ අත්තිකාරම් බී ගිණුමේ හිඟ ණය ශේෂ , අදාළ ණය ගැතියන්ගේ ඇපකරුවන්ගෙන් / විශ්‍රාම හෝ මරණ පාරිතෝෂිතයෙන් අයකර ගැනීමට හැකි සෑම විටකදීම කටයුතු කර ඇත.එලෙස අයකරගත නොහැකි ණය මුදල් සඳහා අදාළ ණය ගැතියන්ට නඩු පැවරීම සඳහා නීතිපති උපදෙස් විමසා ඇත.
17. පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පත් සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	➢ පොදු තැන්පත් ගිණුමේ හදුනාගත්, හිමිකම් නොපෑ වසර 02ක කාලයක් ඉක්ම වූ සාමාන්‍ය ඇප තැන්පත් බොහොමයක් 2023 මුදල් වර්ෂයේ දී රාජ්‍ය ආදායමට බැර කර ඇත.ඉඩම් ඉල්ලීම් සඳහා වන ඇප තැන්පතු , තැන්පත් කළ දිනයේ සිට වසර 10ක් සම්පූර්ණ වූ පසු ද ව්‍යාපෘති අරමුදල් තැන්පතු ව්‍යාපෘතිය නිම කළ දින සිට වර්ෂ 02ක් සම්පූර්ණ වූ පසුද හිමිකම් සඳහා ඉදිරිපත් නොවුවහොත් රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරමි.එමෙන් ම 2024 මුදල් වර්ෂයේ සිට සෑම අර්ධ වර්ෂයක් අවසානයේ දීම ඉකුත් වූ සියලුම තැන්පත් පිළිබඳ ව ලැයිස්තු පිළියෙළ කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.
18. මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කර නොතිබිණි.	➢ 2021 මුදල් වර්ෂයේ සියලුම තත්කාර්යය අතුරු අග්‍රිම නියමිත කාලය තුළ දී ම නොවූව ද , පියවීමට කටයුතු කර ඇත.2022 මුදල් වර්ෂයේ සිට සියලුම අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කිරීමට කටයුතු කර ඇත.
19. වාර්ෂික කාර්ය සාධන වාර්තාව නිසි පරිදි පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා කටයුතු ආරම්භ කර නොතිබිණි.	➢ 2022 වර්ෂයේ අප්‍රේල් මාසයේ සිට රට තුළ උද්ගත වූ ආර්ථික,සමාජීය හා දේශපාලන අර්බුද තත්වය හේතුවෙන් කාර්යාල කටයුතු නිසි ලෙස ක්‍රියාත්මක නොවීම මත 2021 වර්ෂයට අදාළ කාර්ය සාධන වාර්තාව සකස් කිරීම සඳහා තොරතුරු ලබා ගැනීම අපහසු විය.එමෙන් ම කාර්ය සාධන වාර්තාව සකස් කර එහි දල පිටපත අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමේ දී එය සංශෝධනයට ලක් වූ අතර අදාළ සංශෝධනයන් ඇතුළත් කර 2023.03.15 දින ගරු පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී.එය ආංශික අධීක්ෂණ කාරක සභාවේ 2023.05.23 දින සාකච්ජාවට ගන්නා ලදී.
20. අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන තිබුණි.	➢ අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන නොමැත.

UPDF
WWW.UPDF.COM

1. ඉල්ලා සිටිනු ලබන තොරතුරු ලබා නොදීම සම්බන්ධව ඉදිරිපත්වන පැමිණිලි ලේඛනගත කිරීම හා ඒ සම්බන්ධයෙන් ගන් ලැබූ ක්‍රියාමාර්ග පැහැදිලි කරන ලේඛන පවත්වා නොතිබීම.	➢ 2024 මුදල් වර්ෂයේ සිට තොරතුරු පනතේ විධිවිධාන අනුව ,ඉල්ලා සිටිනු ලබන තොරතුරු ලබා නොදීම සම්බන්ධව ඉදිරිපත්වන පැමිණිලි ලේඛනගත කිරීම හා ඒ සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග පැහැදිලි කරන ලේඛන නඩත්තු කිරීමට කටයුතු කරමි.
2. ආයතනය පිළිබඳව මහජනයාට අවශ්‍යය තොරතුරු ලබාදීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොතිබුණි.	➢ ආයතනය පිළිබඳව මහජනයාට අවශ්‍යය තොරතුරු ලබාදීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර ඇත.මෙම වර්ෂයේ දී ඒ සඳහා ලබා දී ඇති ප්‍රතිපාදන හා පවත්නා මුදල් ප්‍රමාණයන් සැලකිල්ලට ගෙන එය යාවත්කාලීන කිරීමට අවශ්‍ය කටයුතු සිදු කෙරේ.
3. ආයතනයේ පවත්වා ගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	➢ වෙබ් අඩවියේ අදාළ යාවත්කාලීන කටයුතු සිදු කිරීමේ දී , මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දීමට කටයුතු කරමි.
4. සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	➢ 2021 වර්ෂයේ දී සැලසුම් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමට අවශ්‍යය කටයුතු සම්පාදනය කළ ද නැවත කොවිඩ් වසංගත තත්වය ව්‍යාප්ත විය.මාර්ගගත ක්‍රමය ඔස්සේ සිදු කළ හැකි වූ පාඨමාලා නිම කිරීමට හැකි විය.2024 වර්ෂයේ සියලුම නිලධාරීන්ට පැය 12ක් ආවරණය වන පරිදි පුහුණු වැඩ සටහන් සකස් කරන ලදී.දෙපාර්තමේන්තුවේ පුහුණු සඳහා වෙන්වන ප්‍රතිපාදන මත එම සැලසුම යම් සංශෝධනයන්ට ලක් කිරීමට ද සිදුවේ.
5. ආයතනයේ ගිණුම් පිළිබඳ විගණණ මතය ව්‍යාවන මට්ටමේ හෝ අභිතකර මට්ටමේ විය.	➢ 2024 මුදල් වර්ෂයේ දී ආයතනයේ ගිණුම් පිළිබඳ විගණණ මතය සාධනීය මට්ටමකට ගෙන ඒමට අවශ්‍යය පියවර ගනු ලැබේ.
6. විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	➢ 2023 මුදල් වර්ෂයේ සිට විගණකාධිපති වාර්තාවේ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත. දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය මට්ටමින් පවත්නා භෞතික හා මානව සම්පත් හිඟය හේතුවෙන් ඇතැම් නිර්දේශ ක්‍රියාත්මක කිරීම තරමක් දුෂ්කර වී ඇත.
7. නිලධාරීන්ගෙන් රජයට සිදු වූ පාඩු වෙනුවෙන් මු.රෙ.156(1) ප්‍රකාරව අය කිරීම් කර නොතිබුණි.	➢ 2024 මුදල් වර්ෂයේ සිට දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගෙන් රජයට සිදුවන හානි /පාඩු මු.රෙ.විධිවිධාන අනුව , අයකර ගැනීමට කටයුතු කරමි.
8. උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් නිසි පරිදි ස්ථාන මාරුකර යැවීමට කටයුතු කර නොතිබුණි.	➢ දීප ව්‍යාප්ත සේවාවන්ගේ හා ඒකාබද්ධ සේවයට අයත් නිලධාරීන්ගේ ස්ථාන මාරු වීම් රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යාංශ නිලධාරීන් විසින් සිදු කෙරේ.දෙපාර්තමේන්තු ගත නිලධාරීන් වාර්ෂික ස්ථාන මාරුවීම් යටතේ ස්ථාන මාරු කිරීමට කටයුතු කර ඇත.

ඒ.ඒ.ඩී.ඩී.ඩී.අලහකෝන්
ප්‍රධාන ගණකාධිකාරී
වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව.

ඒ.ඒ.ඩී.ඩී.ඩී. අලහකෝන්
ප්‍රධාන ගණකාධිකාරී
වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව,
සම්පත්පාය, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

ඊ.ඒ.පී.එන්.එදිරිසිංහ
වන සංරක්ෂක ජනරාල්
වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව.

ඊ.ඒ.පී.එන්. එදිරිසිංහ
වන සංරක්ෂක ජනරාල්
වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
"සම්පත්පාය", රජමල්වත්ත පාර
බත්තරමුල්ල

ගුණදාස සමරසිංහ
ලේකම්
වනජීවී හා වන සම්පත් සංරක්ෂණ
අමාත්‍යාංශය.

ගුණදාස සමරසිංහ
ලේකම්
වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය